

## භාවනාව නිවන් පිණිස පමණක්ද ?

### ※ මිනිස් සිතේ ස්වභාවය පිළිබඳ බෞද්ධ මතය

– මහාචාර්ය හෙන්රි වීරසිංහ

පුද්ගලයා සසරෙහි බැඳ තබන – සසර දී ඔහුට දුක් විපාක සළසන – මිනිස් සිතේ රූඩ් ඇති ප්‍රබල මනෝභාව කිහිපයක් පිළිබඳ විග්‍රහයක් ඇතුළත් ලිපි පෙළක තුන්වැනි ලිපිය.

### ※ චුල්ල හත්ථි පදෝපම සූත්‍රය

පොසොන් පුර පසළොස්වක පෝදිනක ශ්‍රී ලංකාවට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ – එද මෙහි රාජ්‍යය කළ දේවානම්පියතිස්ස රජුට දේශනා කළ ප්‍රථම ධර්ම දේශනාව විස්තර කැරෙන ලිපියකි.

### ※ දන්සිල් අනුසස් කියා පෑ සසදාව

– නයන තිලක් රත්නායක

'බුදු දහමෙන් ප්‍රභාවිත හෙළ සාහිත කෙත' විශේෂාංගය යටතේ ශ්‍රී ලංකාවේ බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස ප්‍රකට කාව්‍ය ග්‍රන්ථයක් පිළිබඳ විමර්ශනයකි.

### ※ බෞද්ධ අධ්‍යාපනයේ අරමුණු

– උඩුපිහිල්ලේ විමලබුද්ධි හිමි

පුද්ගල පෞරුෂය වර්ධනය කැරෙන අධ්‍යාපනය පිළිබඳ බෞද්ධ ආකල්පය. පුද්ගල විමුක්තිය හා යහපත් දිවි පැවැත්ම අරමුණු කොටගත් බෞද්ධ අධ්‍යාපන ප්‍රතිපත්තියේ සුවිශේෂත්වය.

### ※ Buddha on meat eating

*-by Aryadasa Ratnasinghe*

### ※ නිදොස්සන් සදොස් කර පීඩා කිරීමේ විපාක

– වටගමුවේ ධීරාලංකාර හිමි

පාපයෙන් හා වරදින් වැළකී – යහපත් ගති පැවතුම් ඇතිව ජීවත්වන පුද්ගලයන්ට හිංසා – පීඩා කිරීමේ ප්‍රතිඵල වශයෙන් ඇති වන බරපතල ආදීනව කිහිපයක් පිළිබඳ ඉදිරිපත් කළ විශේෂ බුද්ධ දේශනාවකට – පොසොන් අමාවක පෝද ධර්ම දේශනාවෙන් අර්ථකථනයක්.

### ※ භාවනාව නිවන් පිණිස පමණක් ද?

– බද්දේගම විමලවංශ අනුනාහිමි

භාවනාව – බුදු සමයෙහි පුද්ගල විමුක්තිය කේන්ද්‍ර කොට ගෙන නිර්දේශ කරන ලද්දක් වුවද – එදිනෙද ජීවිතයට එහි අතුරු ඵල වශයෙන් ලැබෙන යහපත් ප්‍රතිවිපාක රැසක් පිළිබඳ මෙම ලේඛක හිමියෝ පාඨක අවධානය යොමු කරති.

### ※ භවයෙන් භවයට යන සිත් පරපුර

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

'සම්සක් මැඳුර' විශේෂාංගය යටතේ හේතු – ඵල න්‍යාය අනුව සිදුවන පුද්ගල සංසාරික පැවැත්ම පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාත්මක විවරණයක් ඇතුළත් – ප්‍රකට හිමිනමක් සමග සිදුකැරුණු සංවාදයක් ඇසුරෙන් සකස් කැරුණු ලිපියකි.

### ※ ශ්‍රී ජයවර්ධනපුර රජමල්වත්ත විපස්සනා භාවනා මධ්‍යස්ථානය

කොළඹ දිස්ත්‍රික්කයට අයත් කෝට්ටේ රාජ්‍ය සභා මාවතේ දියවන්නා ජලාශය අසබඩ සුන්දර – නිසංසල පරිසරයක පිහිටි භාවනා මධ්‍යස්ථානයක් පිළිබඳ තොරතුරු දැක්වෙන ලිපියක් – 'සිත නිවෙන තැන්' විශේෂාංගය යටතේ.

## ෴ ලෝක නාට්‍ය උළෙලට සුමේධ හිමිගේ කපිල වස්තුව

‘බෞද්ධ කලා විචාර’ විශේෂාංගය යටතේ බෞද්ධ නාට්‍යයක් පිළි–බඳ විවේචනයකි. ජපානයේ ඔසාකා නුවර පැවැත්වෙන 7 වැනි ලෝක නාට්‍ය උළෙලේ තරගකාරී අංශයේ – ශ්‍රී ලංකාව නියෝජනය සඳහා තෝරාගෙන ඇත්තේ මෙම නාට්‍යය ය.

## ෴ මදුරාසියේ බුද්ධවීඩු සමාධි බුද්ධ ප්‍රතිමාව

– මූදලක්කුලියේ රතනජෝති හිමි

ඉන්දියාවේ මදුරාසි නගරය අසල පිහිටි බුද්ධවීඩු ගම්මානයේ තිබූ බුද්ධ ප්‍රතිමාව ප්‍රතිසංස්කරණය කිරීම නිමිත්තෙන් පළවන – ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.